

# පූස් පැටියා කොහේද ගියේ?

මෙතාරා රත්නායක

පූස් පැටියා කොහේද ගියේ?

මෙතාරා රත්නායක

පලමු ප්‍රකාශනය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2 ශ්‍රේණිය B

ISBN – 978-624-208-791-7

## පිදුම

මාගේ අම්මට අප්පච්චිට,

අක්කලා දෙන්නටම,

අත්තම්මට අත්තට,

සියලුම ගුරු මෑණිවරුන්ටත්,

මම මේ පොත පුදමි.

පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි  ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණිය යුග කැපීපෙනෙන්නේ  ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝදමත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම  සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණ ගත්කරණී** "ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි

ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලාතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමයා බාලිකා විද්‍යාලය - මහනුවර

ඇස් දෙක ජිල් බෝල දෙකක් වගේ ඇඟ පුළුන් ගුලියක් වගේයි. පුරුපුරු ගා මගේ දැවටෙන අපේ පූසි කිටියා.අපේ ගෙදර කිටියට මම හරිම ආදරෙයි.මම පාසල ඇරී ගෙදර එන විට ඤාව් ඤාව් කියමින් මගේ ඇඟේ දැවටෙයි.



මම කෑම කන විට මගේ කකුලට තට්ටු කරමින් කෑම ඉල්ලයි. කිරි බොන්න හරිම ආසයි මගේ කිටි.



එදා ඉරිදා දිනයක් මම දහම් පාසල් ඇරියේ ගෙදර ආවා. කෙටි දැක්කේ නෑ. මගේ කිටි හැම තැනම හෙව්වා. ඒත් දැක්කෙ නෑ. අක්කලාත් එක්කත් කිටී හෙව්වා.



වෙනදා ඉන්න එක තැනකවත් හිටියේ නෑ. “අනේ අපේ කිටි” අපේ ඇස්වලට කඳුළු ආවා. ගබඩා කාමරය පැත්තෙන් සද්දයක් ඇහුණා. ගිහින් බැලුවා පෙට්ටියක් ඇතුලෙ කිටි ඉන්නවා. අපි හොඳට එබිලා බැලුවා.



පුළුන් ගුලි වගේ පැටව් දෙන්න අම්මාට තුරුල් වෙලා ඉන්නවා. අම්මගෙන් කිරි බොනවා. අපිට හරිම සතුටුයි. අපිට දැන් පූසෝ තුන්දෙනයි. අපි උඩ පැන්නා. සතුටු උනා. පූස් පැටව් ටික ටික ලොකු උනා. අපි එයාලත් එක්ක මිදුලේ සෙල්ලම් කරනවා.නූල් පන්දුවක්එක්සෙල්ලම් කරනව පූස් අම්මා වලිගය වනනවා. පැටව් එයට සතුටු වෙනවා. එය දුටු විට අපිට සතුටුයි.

පාසල් නිවාඩු කාලයක්. අපි පූස්සෝ සමග සෙල්ලම් කරා. වේගයෙන් කුරුල්ලෙක් ආවා. පූස් පැටියෙක් හොටෙන් අල්ලා ගත්තා. වේගයෙන් ඉගැලුනා. අපි හයියෙන් කෑ ගැහුවා.



අක්කා අත්පුඩි ගසමින් කෑ ගස්සමින් ඌ පසුපස දුව ගියා. පූස් පැටියා පිදුරු ගොඩක් උඩට වැටුණා. අක්කා පූස් පැටියා බේරගෙන අපි ළඟට ආවා.



පූස් අම්මා පූස් පැටියා ළඟ තිබූවිට එයා අම්මාගෙන් කිරි බීවා. අම්මා පැටියා ලෙව කෑවා. අපිට හරිම සතුටුයි.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරුපසක් සැකසීම සමාජ වගකීමයි

පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි  මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියන් ගුරුභවතුන් දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය  මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්

වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණීය යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි තම නිර්මාන ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්